**2021 නොවැම්බර් මස 05 වන දින පැවති**

**විශේෂ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2021.11.05**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **11.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **13.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | (එ.ජා.ප) |

**නොදන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **14.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **15.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **16.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **17.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **18.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **19.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **20.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **21.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**නිළධාරීන්:-**

**01.** ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා

**02.** විෂය භාර කළමණාකරන සේවා නිළධාරී අයි.ජී.සී.නයෝමි වීරකෝන් මිය

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා

යන්න සඳහන් කරමින් අද ගරු මන්ත්‍රී වරුන් සියළු දෙනා වෙත අයවැය කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන බවත්, කෙටුම්පත සම්මත කිරීම සුදුසු බවට යෝජනා ස්ථිර කර ගන්නා ලෙසත්, අද දින සම්මත කරන කෙටුම්පත ඊළඟ මහ සභාවේදී 2022 අයවැය ලේඛනය ලෙස ඉදිරිපත් කරන බව සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> 2022 වර්ෂය වෙනුවෙන් ගරු සභාපතිතුමා විසින් සකස් කර ඉදිරිපත් කරන අයවැය කෙටුම්පත සංශෝධනයන්ට යටත්ව සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී.බන්දුලසේන මැතිතුමා</u> -2022 වර්ෂය වෙනුවෙන් සකස් කල කෙටුම්පත සභාගත කළ අවස්ථාවේ තමන් හට අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ කඩ ලැබීම සම්බන්ධයෙන් සතුටු වන බවත්, වසර 09 ක කාලයක් මෙම සභාව තුළ අයවැය සම්මත කරන අවස්ථාව තමන්ට හිමි වුවත් මෙතෙක් කාලයක් පුරා අයවැය කතාවක් ඉදිරිපත් කළ ප්‍රථම අවස්ථාව මෙය වන බවත් අයවැය සම්මත කරන අවස්ථාවේ දී අයවැය දකින්නේවත් නැතිව අයවැය සඳහා විරුද්ධවන බවට හා ජයග්‍රහණය කරන බවට වූ මතයේ සිට කටයුතු කරන මුත් අයවැය අධ්‍යයනය කිරීම තුළ පමණක් එය ක්‍රියාත්මක කරනවාද නැද්ද යන්න තීරණය කල යුතු සේම කිසිම හේතුවක් නිසා කිසිම දිනෙක අසනීපයක් හැරුණුකොට සභාවක් වර්ජණය කල නොහැකි සේම එය තහවුරු කළ හොත් සභික ධූරය පවා අහිමි විය හැකි බවත්, යම් කිසි කාරණයක් සම්බන්ධයෙන් ඡන්දය විමසීමේ දී ඡන්දය භාවිතා නොකර සිටීමත් සභික ධූරය අහිමි වීමට හැකි ප්‍රබල කාරණයක් බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.
අනතුරුව ගරු සභිකවරුන්ගේ ඡායා රූප වලට යටින් එතුමන්ගේ ලිපිනය හා දුරකතන අංකය සඳහන් කිරීම සුදුසු බවත්, කොට්ඨාශ විස්තර සඳහන් කර ඇති පිටුවේ හිදෝගම හා තුරුවිල කොට්ඨාශය තුළ තුලාන ඉවත්කර ඇති බවත්,නව ව්‍යාපෘති හා ආදායම් උත්පාදන ව්‍යාපෘති ලෙස විවිධ ව්‍යාපෘති සඳහන් කළත් නෙළුබැව පොළ භූමිය සම්බන්ධයෙන් කිසිදු සටහනක් හෝ ආදායමක් සටහන් කර නොමැති බව සේම නෙළුබැව ආපන ශාලාව අළුතින් ඉදිකර ඇතත් එහි ආදායම් ද ඇතුළත් වීම අතිශය වැදගත් බව සඳහන් කරන ලදී.
තවද සංවිධාන ව්‍යුහය තුළ ලේකම්ට ඉහළින් උපදේශක කාරක සභාව පමණක් විය යුතු අතර , කමිටු ඊට පහළින් ඇතුළත් විය යුතු බවත්, ආමනේ තුලානයේ පිහිටි ආමනේ වැව ද අදාළ වැව් නාම ලේඛනයේ සටහන් වී නොමැති බවත්, සුසාන භූමි සම්බන්ධයෙන් දක්වා ඇති ඉඩම් වල ප්‍රමාණය නිවැරදි ද යන්න තවදුරටත් පරික්ෂා කිරීම සුදුසු බවටත් සඳහන් කරන ලදී
තවද වරිපනම් බදු ලක්ෂ 05 ක් දක්වා අඩු කිරීම ගැටළුකාරී නොවන නමුත්, මේ සම්බන්ධයෙන් ගණනය සිදු කළ ගෘහ ඒකක ප්‍රමාණය කොපමණද යන්නත්, ව්‍යාපාර බදු හා වෙළද බලපත්‍ර 2021 ආදායම සැලකිල්ලට ගත්තත්,2019 වර්ෂයේ දී 2020 ඇස්තමේන්තුව ඉක්මවා අයකර ගෙන තිබෙන බවත්, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත්, දැන්වීම් පුවරු වෙනුවෙන් රු ලක්ෂ10 ක් ඇස්තමේන්තු කිරීම හොඳ වුවත්, ඊට අදාල වැඩ පිළිවෙල කුමක්ද යන්නත්, ගලි බවුසරය වෙනුවෙන් ආදායම් ඇතුළත් කර ඇති සේම ගලි බැහැර කිරීම වෙනුවෙන් විධිමත් ස්ථානයක් ස්ථාපිත කිරීම සිදුකළ යුතු බව සඳහන් කරන ලදී.

තවද කීරික්කුලම කසල අංගනයේ ආදායම 2022 වර්ෂයට ඇතුළත් කර ඇති සේම ඊට අදාලව මෙතෙක් අයකර ගැනීමට නොහැකි වූ හිග ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු බවත් වැසිකිසි පහසුකම් සැපයීම යටතේ රුපියල් 5,000.00 ආදායමක් ඇස්තමේන්තු කිරීම සඳහා යම් වැඩ

පිළිවෙලක් සකස් කර ඇතිය යන්න තමන් විශ්වාස කරන බවත්, කොම්පෝස්ට් ව්‍යාපෘති වෙනුවෙන් ආදායම ලෙස රුපියල් ලක්ෂ 12ක් ඇස්තමේන්තු කර ඇති බැවින් එහි වැඩපිළිවෙල සම්බන්ධයෙන්ද විමසන ලදී. තවද බ්ලොක් ගල් ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් ලක්ෂ 55ක් ඇස්තමේන්තු ගත ආදායමක් ලෙස ඇතුළත් කිරීම තුළ නැවත විග්‍රහයක් සිදුකර ගන්නා ලෙසත් දැනට පවතින ව්‍යාපෘතිය හා ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘතිය මගින් මීට වඩා ආදායමක් ලබාකර ගැනීමේ හැකියාවක් පවතින බවත් සඳහන් කරන ලදී.

තවද ආදාහනාගාරය වෙනුවෙන් අවශ්‍ය ජලය වෙනුවෙන් රුපියල් 1,000.00ක් වෙන්කර ඇති බැවින් ගෑස් සඳහා ද සංකේත මුදලක් ඇතුළත් කළ යුතු බවත්, වර්ෂය තුළ යම් වැය මාරුවක් සිදු කළේ නම් ඒ සම්බන්ධයෙන් ගරු මහජන නියෝජිතයින්, දැනුවත් වන්නේ කෙසේද, එය සභාව තුළ ඉදිරිපත් කළ යුතු බව සඳහන් කරන ලදී.

තවද කොම්පෝස්ට් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ආදායම හා වියදම යන දෙකම රුපියල් ලක්ෂ 12 ලෙසට සමාන වීම සඳහන් කලේ මන්ද යන්නත්, බ්ලොක් ගල් මධ්‍යස්ථානය සඳහා සිමෙන්ති හා චිප්ස් පමණක් වියදම් ඇස්තමේන්තු කර ඇති නමුත් මෙයට අදාළ වෙනත් වියදම් නොමැතිද යන්න විමසන ලදී. තවද වාහන සේවා මධ්‍යස්ථානය සඳහා රුපියල් ලක්ෂ 3ක ආදායමක් පමණක් ඇතුළත් කර ඇති නමුත් සත්‍ය ලෙස ගත් කළ මීට වඩා වැඩි විය නොහැකි ද යන්නත් විමසන ලද අතර ගරු සභාපතිතුමා සමඟ ඇති වූ මත වාදයන් හමුවේ සිදු වූ සෝෂාව නිසා කිසිවක් පැහැදිලි නොවූ අතර ගරු මන්ත්‍රී ඩී.පී. බන්දුලසේන මැතිතුමා සිය සංශෝධන හා යෝජනා ඉදිරිපත් කිරීම අවසන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ජී.ශාන්ත මැතිතුමා -</u> 2022 වර්ෂයේ අයවැය කෙටුම්පත අයවැය කථාවක් ලෙසින් ඉදිරිපත් කිරීම අගය කරමින්,අයවැය තුළ 2022 සම්බන්ධයෙන් කථා කිරීමට පෙර 2021 වර්ෂය සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු සේම ඒ තුළ අප ලබාකර ගැනීමට උත්සහ කළ ඉලක්ක බොහෝමයක් ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බවත්, මෙය සමස්ථ ලෝකයේම සිදුවන්නක් බැවින්,ගෙවීගිය කාලය තුල සමස්ථ ආදායම් රුපියල් ලක්ෂ 67ක් වුවත් උත්පාදිත ආදායම් ලෙස ලක්ෂ 26 කට ආසන්න මුදලක් පවතින බවත්, ඒ තුල 5.6% අතිකාල හා ගමන් වියදම්, සැපයුම් සහ උපකරණ වෙනුවෙන් 10.97%ක් ,අළුත්වැඩියා හා නඩත්තු 7.4%ක් ,පරිපාලන වියදම් සඳහා 3.13% ත් සුභ සාධක සඳහා 3.2%ක මුදලකුත් වැය කර ඇති බවත්, ඒ අනුව පරිපාලන මුදල ඉක්මවා සුභ සාධනය වෙනුවෙන් 2021 වර්ෂය තුළ මුදල් වැය වී ඇති බවත් ,ඒ සම්බන්ධයෙන් අප සතුටු වන බවත් ප්‍රාදේශීය සභා අරමුදලින් කරන ලද කර්මාන්ත වෙනුවෙන් 15.99%ක් වියදම් වෙනත් ගෙවීම් තුළ අනියම් වැටුප් ද සමඟ 30% පවතින බවත් එය මූල්‍යමය ගැටළුවකට මුහුණ දීමට අවශ්‍ය නොවූ බවට සාක්ෂි දරණ බවත් සඳහන් කරන ලදී.

තවද 2021 වර්ෂය තුළ සමස්ථ ආදායමෙන් 43%ක්ම වාහන කුලී ආදායම මගින් ලබාගෙන ඇති බවත්, ලබන වසරේදී මෙම ඉලක්කය ඉක්මවා යා හැකි බවත්, බ්ලොක් ගල් ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබේ යැයි සටහන් කර ඇති ආදායම මීට වඩා ඉහළ යා හැකි වුවත්, ඉදිරි කාළය අවිනිශ්චිත බැවින් මෙම ආදායම ඇතුළත් කළ යුතු බවත්, වාහන සේවා මධ්‍යස්ථානයේ ආදායම ලෙස රුපියල් ලක්ෂ3ක් ඇතුළත් කර ඇතත් ප්‍රාදේශීය සභාව සතු වාහන සේවා කිරීම මේ යටතේ කරන බැවින් හරස් සටහන් මගින් මීට වඩා ආදායමක් ඇතුළත් කළ හැකි බවත්,

ආදාහනාගාරයද කවරක්කුළම කඩ කාමර ද ඉදිකිරීම එළඹෙන වසර තුළ දී ඉදිකර ගැනීම කළ හැකි වුවහොත් ආදායම් මීට වඩා වැඩිකර ගත හැකි බවත්,සත්‍ය ලෙසම අයවැය ගත ආදායම් ඉලක්ක පසු කර යාමට හැකි වුවහොත්, සුභ සාධක වියදම් ආදිය වෙනුවෙන් වෙන් කර ඇති මුදල් වියදම් කළ හැකි වන බවත් 2022 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කල අයවැය සාර්ථක අයවැයක් ලෙස මා දකින බවත් සඳහන් කරමින් අයවැය වෙනුවෙන් සහය දුන් සියළු දෙනා වෙත ස්තුතිවන්ත වෙමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී විමලසිරි මන්ත්‍රීතුමා</u> - 2022 අයවැය ඉදිරිපත් කළ ආකාරයෙන්ම සාර්ථක වන බව පිළිබිඹු වන බවත් කොට්ඨාශ මට්ටමෙන් හා ජනතාව වෙනුවෙන් මෙසේ විය යුතුය යන්න අදහස් කරන පුද්ගලයින්ගෙන් යෝජනා ලබා ගනිමින් සකස් කළ අයවැය තුළම තවදුරටත් ඇතුල් කළ යුතු සංශෝධන හා යෝජනා ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිමින්, .අද මෙලෙස කෙටුම්පත් සාකච්ඡාව කරන බවත් මේ කාල සීමාව තුළ පසුගිය වර්ෂයේ දික්‍රි යාත්මක කිරීම සඳහා යෝජනා ලබා ගත්තත් පවතින තත්වය හමුවේ ක්‍රියාත්මක කිරීමට හා එය ඉදිරියට කරගෙන යාමට නොහැකි වූ වත් ඉදිරි වර්ෂයේදී සෞභාග්‍යයේ දැක්ම යටතේ ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා ගෙන යන වැඩ පිළිවෙළ තුළ අපට සතුටු විය හැකි වන බවත් , දීර්ඝ ලෙස කරුණු දක්වමින් අයවැයට පක්ෂව සිය අදහස් දැක්වීම සිදු කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිතුමිය</u> - ජනතාවගේ සුභ සාධනය වෙනුවෙන් අවශ්‍ය වැඩ පිළිවෙල ආයතනයක් ලෙස ඉටුකරන්නේ කෙසේද, යන්න ඇතුළත් කර සකස් කළ අයවැය ලේඛනයක් පළාත් පාලන නීතියට අනුව සම්මත කර ගැනීම සම්බන්ධව කිසිම ගරු මහජන නියෝජිතයෙකු වෙත විරුද්ධවීමේ හැකියාවක් නොමැති බවත්, මේ වෙනුවෙන් ගරු සභාපතිතුමාට අධිකරණයට පවා යාමේ හැකියාව පවතින බවත්, මේ සඳහා විරුද්ධ වීමට සාධාරණ හේතු තිබිය යුතු බවත්, එය ප්‍රකාශයක් ලෙස ඉදිරිපත් කල යුතු බවත්, සඳහන් කරන ලදී.

තවද, සීමිත සම්පත් භාවිතා කරමින් මෙම වර්ෂය තුළ අසීමිත ලෙස සංකීර්ණ වූ ගැටළු රැසකට විසඳුම් ලබා දීමට උත්සහ ගත් සේම ඒවා සාර්ථක වී ඇති බවත්, 2021 වර්ෂයේ සිට බලාපොරොත්තුවෙන් සිටි වැඩ ඒකකය ස්ථාපිත කිරීම වෙනුවෙන් 2022 වර්ෂයේ අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම සම්බන්ධයෙන් සතුටු වන සේම සංශෝධිත කෙටුම්පත සඳහා බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කාර්යය ඉටු කිරීම සඳහා ළමා හා කාන්තා කමිටුවක් ස්ථාපිත කිරීමට තමන් යෝජනා කරන බවත්, විදාතා සම්පත් මධ්‍යස්ථානය වෙනුවෙන් රුපියල් 6000.00 කට එහා ගිය කුළියක් අය කිරීමේ හැකියාවක් පවතින බවත්, කසල සම්බන්ධයෙන් පොහොර නිෂ්පාදනය සම්බන්ධයෙන් පමණක් කතා කලත්, ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණය වෙනුවෙන් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම තුළ ජනතාවට මෙන්ම ප්‍රාදේශීය සභාවටද ආදායමක් ලබා ගැනීමේ හැකියාව ඇති බවත් ව්‍යාපෘති වාර්ථා සකස් කර ඉදිරිපත් නොකිරීම මත විවිධ ගැටලු මතුවන බැවින් එය නිවැරදිව සකස් කල යුතු බවත් අඩු ආදායම්ලාබී පළාත් පාලන අයතනයක් ලෙස මේ ආකාරයෙන් හෝ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අප සතුටු විය යුතු බවත් සඳහන් කරන ලදී.

තවද සිය 247 තුලානය තුළ මාර්ග ඉවත් කර ඇති බැවින් ඒ තුළට මාර්ටින් වික්‍රමසිංහ මාවත, සූරියගහ මාවත, රාහුල මාවත, ධර්ම රාජ මාවත, ධර්මාලංකාර මාවත යන මාර්ග ඇතුළත් විය යුතු බව සඳහන් කරන ලදී. තවද පසුගිය වර්ෂ දෙස බලන කල ස්වයං උත්පාදන ආදායමක් පවතින සේම එය ප්‍රසංසාවට ලක්විය යුතු බවත්, ගෙන ආ අයවැය කෙටුම්පත ජනතාවට එල ප්‍රයෝජනයක් ඇති වන වඩාත් සුඛිත මුදිත ආර්ථිකයක් නගා සිටුවීමට හැකි වේවා යි පතමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රි ඩී.පී බන්දුලසේන මැතිතුමා හා ගරු මන්ත්‍රි පී කරුණාරත්න මැතිතුමා පිළවෙලින් ප.ව 12.05 හා 12.10 සභා ලර්භයෙන් පිටව යන ලදී.

<u>ගරු උප සභාපති සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> තුලාන 34 කින් සමන්විත 72,000 ක ජනතාවක් ජීවත්වන උපතේ සිට මරණය දක්වා ජනතාවට සේවය කරන ප්‍රාදේශීය සභාවක් ලෙස 2022 අයවැය කෙටුම්පත

සාකච්ඡාව පවත්වන අවස්ථාවේදී ගරු සභාපති තුමා සිදුකළ කාර්යය ඉතා අගය කල හැකි බව සඳහන් කරමින් සිය ස්තූතිය ප්‍රකාශ කරන ලදී ගෙවුනු වසර කිහිපය තුල විවිධ අපහසුතා මධ්‍යයේ අඩු ආදායම් ලාභී ප්‍රාදේශීය සභාවක් වුවත් ආදායම්ලාබී සභාවක් ලෙස සාර්ථක අයුරින් අභියෝග ජයගනිමින් ජනතාවට සේවය සැපයීම සම්බන්ධව සෑහීමකට පත්විය යුතු බවත් 2022 වර්ෂය තුළ පසුගිය වර්ෂ වලට වඩා අභිමානයෙන් මුහුණ දියහැකි විෂය ක්ෂේත්‍ර ගණනාවක් අතුළත්වන බවත් සඳහන් කරන ලදී.

තවද පසුගිය වසරේ මුදල් ගණනයේදී ආදායම් ලැබීම් තුළ කුලී ආදායම, බලපත්‍ර ගාස්තු,ව්‍යාපෘති ආදායම් 2021 වර්ෂයට වඩා 2022 වර්ෂය තුළ ඉලක්ක ගත ආදායම වැඩි වී ඇති සේම ඒතුළින් බල ප්‍රදේශයේ ජනතාව නගා සිටුවීමට හැකිවන බවත් කුඩා නෙළුබැව කොට්ඨාශයේ ඉදි කළ ආපන ශාලාව ජනතාවට භාවිත කිරීමට අවස්ථාව 2021 වර්ෂය තුළ හිමි නොවුන හොත් 2022 වර්ෂයේ ජනවාරි වන විට එය ජනතාවට විවෘත කිරීමේ හැකියාව පවතින බවත් ඒ තුළින් ද ආදායම් උත්පාදනය වන බවත් බ්ලොක් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම තුළ ද ආදායම ශක්තිමත් කිරීමේ හැකියාව 2022 වර්ෂය තුළ හිමි විය හැකි බවත් එය ද විශාල ජයග්‍රහනයක් බවත්, මොරගොඩ තුරුලිය සෙවණට අදාල ව්‍යාපෘතිය තුළින් ද 2022 වර්ෂය තුළ ආදායම් උත්පාදිත ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ හැකියාව ලැබේවා යි යන්න අපේක්ෂා කරන බවත්, ජල පිරිපහදු මධ්‍යස්ථානය තුළින් ජයබිම උත්සව ශාලාවට එහා ගිය ආදායමක් ලැබීමේ හැකියාවට පත්ව තිබීමත්, එය සේවා සැපයීමේ ලෙසම ආදායම් උත්පාදනයක් ලෙස පැවතීම සතුටට කරුණක් බවත්, කසළ අංගනය සම්බන්ධයෙන් ඇතුළත් කර ඇති ආදායම ද අප හිමි කර ගැනීමට කටයුතු කළ යුතු බවත් සඳහන් කරමින් 2022 වර්ෂය තුළ නිකුත් කළ අයවැය ඉතාම සුභ වාදී ජනතාවට සේවය සැපයිය හැකි මනා ලෙස සැකසූ අයවැයක් ලෙස ඉලක්කම් වලට සීමා නොකර ගිය වසරේ පසු බෑමට ලක් වූවත් 2022 වර්ෂය තුළ එය සාර්ථක කර ගැනීමට ශක්තිය ධෛර්යය ලැබේවායි පතමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ටී.පී.සිරිසේන මැතිතුමා</u> 2022 වර්ෂය වෙනුවෙන් සැකසූ අයවැය සාකච්ඡා කරන අවස්ථාවේ විපක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් නොසිටීම සම්බන්ධව කණගාටුවන බවත්,2022 වර්ෂය තුළ ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් වූ කාර්යය භාර්යය ඉටු කිරීම සඳහා සකස් කරන අයවැය තුළ ඉතාමත් සුදුසු සහ ආකර්ශණීය යෝජනා හා ප්‍රතිපාදන දක්නට ලැබෙන බවත් අයවැය ලේඛනයේ මුල් පිටු තුළ සිය කොට්ඨාශයේ තුලාන් සඳහන් කිරීම අතපසු වී ඇති බව ප්‍රකාශ කරන ලදී.

තවද 2022 වර්ෂය වෙනුවෙන් සකස් කළ අයවැය ලේඛනය සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන ලෙසට සංඛා ලේඛන ඇතුළත් කර ඇති බවත් ඒ වෙනුවෙන් සතුටු වන සේම සිය කොට්ඨාශය තුළ පවතින එල්ලංගා පද්ධතිය තුලින් මිරිදිය මත්ස්‍යයින් ඇති කිරීම සඳහා වැඩ පිළිවෙලක් දියත් කිරීමේ හැකියාව පවතින බවත්, එම යෝජනාව අයවැය තුළ සංශෝධනයක් ලෙස ඇතුලත් කරන ලෙසත් සඳහන් කරන ලදී.

තවද, ප්‍රාදේශීය සභාවක් ලෙස මෙය ක්‍රියාත්මක කිරීමේ දී විවිධ හාදා ඇතිවිය හැකි නමුත්, ඒවා නිවැරදි කරගනිමින් ඉදිරියට යාම සඳහා උපරිම සහයෝගය ගරු සභිකයින් ලෙස ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් ඒ වෙනුවෙන් කැපකිරීම් සිදු කරන ලෙසද ප්‍රකාශ කරමින්,2022 වර්ෂය තුළ වේගවත් සංවර්ධනයක් ඉටු කරගනිමු යන්න ප්‍රකාශ කර 2022 වර්ෂය වෙනුවෙන් සකස් කළ අයවැය සහ සම්මත කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් හා අයවැය සකස් කිරීම වෙනුවෙන් සහයෝගය දැක් වූ සියලු දෙනා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී.කුමාරදාස මැතිතුමා</u> අද දවස ජයග්‍රාහී දිනයක් බව ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රිනි ජී.ඒ.නෙළුම් මැතිණිය පමණක් නිවාඩු බව දැනුම් දී ඇති බව සඳහන් එය පමණක් වාර්ථා ගත කරන ලෙසත්, සභාවකට පැමිණීම වර්ජනය කරමින්, ඉතා සැහැල්ලුවෙන් කටයුතු කල අනෙක් ගරු මන්ත්‍රීතුමන්ලා සම්බන්ධයෙන් හෙලා දකින බවත්, සඳහන් කරමින් කෙටුම්පත සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කර ගැනීම සම්බන්ධයෙන් විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින්, පහත සඳහන් සංශෝදනයන්ට යටත්ව 2022 අයවැය කෙටුම්පත ඒකමතිකව සභා සම්මත විය.

**ආදායම්**

6-4207 - කුලී ටෙන්ඩර් ගාස්තු තුලට නෙළුබැව ඉදිකල ආපන ශාලාවේ වාර්ෂික ටෙන්ඩර් ගාස්තු ඇතුළත් කිරීම රු.18,000.00

| පෙර | පසු |
|---|---|
| 6-4207 - රු. 2,836,840.00 | 6-4207 - රු.2,854,840.00 |

ස්ථාවර තැන්පතු සඳහා පොළිය රු.7,620.00 ඇතුළත් කිරීම 1-4703 -7,620.00

බ්ලොක් ගල් නිෂ්පාදනය සඳහා ආදායම වැඩි කිරීම. සභාව පිහිටි ඉඩමේ පැරණි වැඩපල සඳහා මාස 06 ක් සඳහා ආදායම ඇතුළත් කිරීම.

| පෙර | පසු |
|---|---|
| 4-4901 - රු.5,500,000.00 | 4-4901 රු.7,176,000.00 |

**වියදම්**

4-1202 බ්ලොක් ගල් සඳහා සැපයුම් යටතේ ශ්‍රමික වැටුප්, විදුලිය, යන වියදම් නව වැඩපළට රු.1,434,000.00 ක් ඇතුළත් කිරීම.

| පෙර | පසු |
|---|---|
| 4-1202 - රු.4,000,000.00 | 4-1201- රු.5,434,000.00 |

3-1209 ආදාහනාගාර ගෑස් සැපයුම් සඳහා රු.1000.00 සංකේත ප්‍රතිපාදන ඇතුළත් කිරීම.

සුභ සාධක ගෙවීම් යටතේ 4-1501-4 බල ප්‍රදේශයේ ජනතාවට පැළ බෙදාදීම සඳහා රු.116,620.00 ක මුදලක් වෙන් කිරීම.

1-1503 උත්සව සඳහා ගෙවීම් යටතේ රු.100,000.00ක ප්‍රතිපාදන වෙන් කිරීම.
3-1605 මදුරු සහ කෘමි පාලනය -බෝවන හා බෝ නොවන රෝග සඳහා රු.100,000.00 ක් දක්වා ප්‍රතිපාදන වැඩි කිරීම.

| පෙර | පසු |
|---|---|
| 3-1605 රු.50,000.00 | 3-1605 - රු.100,000.00 |

ගල් රෝලක් මිලදී ගැනීමට වෙන් කර තිබූ රු.මිලියත 01 ක ප්‍රතිපාදනය රු.මිලියන 7 දක්වා වැඩි කිරීම.
බේබි ගල් රෝල සඳහා වෙන්කර තිබූ රු.මිලියන 7.5 ක ප්‍රතිපාදන රු. මිලියන 1.5 දක්වා අඩු කිරීම.

ආපදා කලමණාකරන අමාත්‍යාංශය යටතේ රු මිලියන 11ක මුදලක් කාණු පද්ධතිය සකස් කිරීම සඳහා වෙන් කිරීම.

අනතුරුව මේ සම්බන්ධයෙන් අදහස් දැක් වූ ගරු සභිකවරුන් සියළු දෙනා වෙත හා කාර්යය මණ්ඩලයේ සියළු දෙනා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2022 වර්ෂයේ අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීම වෙනුවෙන් පැවැත් වූ විශේෂ මහ සභා රැස්වීම ප.ව.12.35ට අවසන් කරන ලදී.

....................................
බී.එච් ප්‍රදීප් නිශාන්ත,
ලේකම්,
නැ.නු.ප ප්‍රාදේශීය සභාව,
විජයපුර.

..........................................
එස්.බී කුමාරදාස,
සභාපති ,
නැ.නු.ප්‍රාදේශීය සභාව,
විජයපුර.